# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2367/12 - 2024 ජනවාරි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2024.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**දුම්රිය ආඥාපනත**

දුම්රිය ආඥාපනතේ (200 පරිච්ඡේදයේ) 03 හා 04 වගන්ති මගින් තමා වෙත පැවරී ඇති බලතල යටතේ මුදල් අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව ප්‍රවාහන අමාත්‍යවරයා විසින් පනවා ඇති ව්‍යවස්ථාව.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍ය.

2024 ජනවාරි මස 16 වැනි දින,
ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශයේ දී ය.

ව්‍යවස්ථාව

1926 පෙබරවාරි මස 26 වැනි දින හා අංක 7514 දරන *ගැසට් පත්‍රයේ* අතිරේකයන්හි පළකරන ලද හා වරින්වර සංශෝධනය කරනු ලැබූ පාර්සල් ප්‍රවාහනය අ.........වා.........සු......... ප්‍රවාහනය, බඩු සප්‍රාණික සතුන් ප්‍රවාහනය සහ ගාස්තු පිළිබඳ රෙගුලාසි 2024 පෙබරවාරි මස 01 වැනි දින සිට පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

පාර්සල් ප්‍රවාහනය

**රෙගුලාසි 34 (ඩී)** **මාර්ගෝපකරණ කාමර ගාස්තු :**

34 (ඩී) රෙගුලාසියේ රු. 15.00 ලොප්කර ඒ වෙනුවට රු. 50.00 ආදේශ කරන්න.

දුම්රිය ස්ථානයට පාර්සලය ලැබුණු වේලාවේ සිට පාර්සලය ලැබී පැය 48 ක් ඇතුළත ලබන්නා විසින් පාර්සලය භාර නොගත්තේ නම් පාර්සලය භාර ගනු ලබන දින දක්වා වන ඉතිරි දින ගණන සඳහා මාර්ගෝපකරණ කාමර ගාස්තු ගණන් බැලිය යුතුය.


1A - G 41251 — 07 (2024/01)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**රෙගුලාසි 34 (ජී) පාර්සල් ගාස්තු :**

34 (ජී) රෙගුලාසියේ දැනට පවත්නා පාර්සල් ගාස්තු චක්‍ර ලොප් කර පහත සඳහන් නව පාර්සල් ගාස්තු චක්‍රය ආදේශ කරන්න.

**34 (ජී) සාමාන්‍ය පාර්සල් ගාස්තු චක්‍රය :**

දුර ඉහළ කිලෝ මීටරයටත් බර ඉහළ කිලෝ ග්‍රෑමයටත් වටයා චක්‍රයට අනුව ගාස්තු ගණනය කරන්න.

| *දුර (කි.මී.)* | *බර* | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | *1 kg* | *2-5 kg* | *6-10 kg* | *11-15 kg* | *16-20 kg* | *21-25 kg* | *26-30 kg* | *31-35 kg* | *36-40 kg* | *41-45 kg* | *46-50 kg* |
| 0-25 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 |
| 25-40 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 170.00 | 170.00 |
| 40-55 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 170.00 | 170.00 | 170.00 | 170.00 | 170.00 |
| 55-70 | 150.00 | 150.00 | 150.00 | 150.00 | 170.00 | 170.00 | 170.00 | 170.00 | 170.00 | 170.00 | 170.00 |
| 70-85 | 150.00 | 150.00 | 150.00 | 170.00 | 170.00 | 170.00 | 170.00 | 170.00 | 170.00 | 190.00 | 190.00 |
| 85-100 | 150.00 | 150.00 | 150.00 | 170.00 | 170.00 | 170.00 | 170.00 | 170.00 | 190.00 | 190.00 | 190.00 |
| 100-115 | 150.00 | 150.00 | 150.00 | 170.00 | 170.00 | 170.00 | 170.00 | 190.00 | 190.00 | 190.00 | 190.00 |
| 115-130 | 150.00 | 150.00 | 170.00 | 170.00 | 170.00 | 190.00 | 190.00 | 190.00 | 210.00 | 210.00 | 210.00 |
| 130-145 | 150.00 | 150.00 | 170.00 | 170.00 | 190.00 | 190.00 | 190.00 | 210.00 | 210.00 | 230.00 | 230.00 |
| 145-160 | 150.00 | 150.00 | 170.00 | 170.00 | 190.00 | 190.00 | 210.00 | 210.00 | 230.00 | 230.00 | 250.00 |
| 160-175 | 150.00 | 170.00 | 170.00 | 190.00 | 190.00 | 210.00 | 210.00 | 230.00 | 230.00 | 250.00 | 250.00 |
| 175-190 | 150.00 | 170.00 | 170.00 | 190.00 | 190.00 | 210.00 | 230.00 | 230.00 | 250.00 | 270.00 | 270.00 |
| 190-205 | 150.00 | 170.00 | 170.00 | 190.00 | 210.00 | 210.00 | 230.00 | 250.00 | 270.00 | 270.00 | 290.00 |
| 205-220 | 150.00 | 170.00 | 190.00 | 190.00 | 210.00 | 230.00 | 250.00 | 250.00 | 270.00 | 290.00 | 310.00 |
| 220-235 | 150.00 | 170.00 | 190.00 | 210.00 | 210.00 | 230.00 | 250.00 | 270.00 | 290.00 | 310.00 | 310.00 |
| 235-250 | 150.00 | 170.00 | 190.00 | 210.00 | 230.00 | 250.00 | 270.00 | 270.00 | 290.00 | 310.00 | 330.00 |
| 250-265 | 150.00 | 170.00 | 190.00 | 210.00 | 230.00 | 250.00 | 270.00 | 290.00 | 310.00 | 330.00 | 350.00 |
| 265-280 | 150.00 | 170.00 | 190.00 | 210.00 | 230.00 | 250.00 | 270.00 | 310.00 | 330.00 | 350.00 | 370.00 |
| 280-295 | 150.00 | 170.00 | 190.00 | 210.00 | 250.00 | 270.00 | 290.00 | 310.00 | 330.00 | 350.00 | 370.00 |
| 295-310 | 150.00 | 170.00 | 190.00 | 230.00 | 250.00 | 270.00 | 290.00 | 330.00 | 350.00 | 370.00 | 390.00 |
| 310-325 | 150.00 | 170.00 | 210.00 | 230.00 | 250.00 | 290.00 | 310.00 | 330.00 | 350.00 | 390.00 | 410.00 |
| 325-340 | 150.00 | 170.00 | 210.00 | 230.00 | 270.00 | 290.00 | 310.00 | 350.00 | 370.00 | 410.00 | 430.00 |
| 340-355 | 150.00 | 170.00 | 210.00 | 230.00 | 270.00 | 290.00 | 330.00 | 350.00 | 390.00 | 410.00 | 450.00 |
| 355-370 | 150.00 | 190.00 | 210.00 | 250.00 | 270.00 | 310.00 | 350.00 | 370.00 | 410.00 | 430.00 | 470.00 |
| 370-385 | 150.00 | 190.00 | 210.00 | 250.00 | 290.00 | 310.00 | 350.00 | 390.00 | 410.00 | 450.00 | 490.00 |
| 385-400 | 150.00 | 190.00 | 230.00 | 250.00 | 290.00 | 330.00 | 370.00 | 390.00 | 430.00 | 470.00 | 510.00 |
| 400-415 | 150.00 | 190.00 | 230.00 | 270.00 | 290.00 | 330.00 | 370.00 | 410.00 | 450.00 | 490.00 | 530.00 |
| 415-430 | 150.00 | 190.00 | 230.00 | 270.00 | 310.00 | 350.00 | 390.00 | 430.00 | 470.00 | 510.00 | 550.00 |
| 430-445 | 150.00 | 190.00 | 230.00 | 270.00 | 310.00 | 350.00 | 390.00 | 430.00 | 470.00 | 530.00 | 570.00 |
| 445-460 | 150.00 | 190.00 | 230.00 | 270.00 | 330.00 | 370.00 | 410.00 | 450.00 | 490.00 | 530.00 | 590.00 |
| 460-475 | 150.00 | 190.00 | 230.00 | 290.00 | 330.00 | 370.00 | 410.00 | 470.00 | 510.00 | 550.00 | 590.00 |
| 475-490 | 150.00 | 190.00 | 250.00 | 290.00 | 330.00 | 390.00 | 430.00 | 470.00 | 530.00 | 570.00 | 610.00 |
| 490-505 | 150.00 | 190.00 | 250.00 | 290.00 | 350.00 | 390.00 | 450.00 | 490.00 | 530.00 | 590.00 | 630.00 |
| 505-520 | 170.00 | 210.00 | 250.00 | 310.00 | 350.00 | 410.00 | 450.00 | 510.00 | 550.00 | 610.00 | 650.00 |
| 520-535 | 170.00 | 210.00 | 250.00 | 310.00 | 350.00 | 410.00 | 470.00 | 510.00 | 570.00 | 630.00 | 670.00 |
| 535-550 | 170.00 | 210.00 | 250.00 | 310.00 | 370.00 | 430.00 | 470.00 | 530.00 | 590.00 | 630.00 | 690.00 |
| 550-565 | 170.00 | 210.00 | 270.00 | 310.00 | 370.00 | 430.00 | 490.00 | 550.00 | 590.00 | 650.00 | 710.00 |
| 565-580 | 170.00 | 210.00 | 270.00 | 330.00 | 390.00 | 450.00 | 490.00 | 550.00 | 610.00 | 670.00 | 730.00 |
| 580-595 | 170.00 | 210.00 | 270.00 | 330.00 | 390.00 | 450.00 | 510.00 | 570.00 | 630.00 | 690.00 | 750.00 |
| 595-610 | 170.00 | 210.00 | 270.00 | 330.00 | 390.00 | 450.00 | 530.00 | 590.00 | 650.00 | 710.00 | 770.00 |

i. විශේෂයෙන් ගාස්තු දැනුම් දී ඇති තැන්වලදී හැර පාර්සලයක් ප්‍රවාහනයට අය කළ යුතු ස්ථාවර ගාස්තුව රු. 140.00 ක් ලෙස ගෙන පහත වගුව අනුව සාමාන්‍ය පාර්සල් ගාස්තු චක්‍රය ගණනය කර ඇත.

කි.ග්‍රෑ. 01 ක් කි.මී. 01 ක් දුර ප්‍රවාහනය සඳහා අය කළ යුතු ගාස්තුව

| *දුර (කිලෝ මීටර)* | *ගාස්තුව* |
|---|---|
| 0 - 100 | ශත 0.01 |
| 100 ට වැඩි - 300 | ශත 0.02 |
| 300 ට වැඩි | ශත 0.025 |

ii. පහත සඳහන් පාර්සල්වලට අමතරව රු. 10,000.00 ට වැඩි වටිනාකමකින් යුත් සෑම පාර්සලයක් සඳහාම වටිනාකමෙන් 0.5% ක ප්‍රතිශතයක් අය කළ යුතුය.

ලොතරැයි ටිකට්/බෙහෙත් ද්‍රව්‍ය/ටයර්/වීදුරු/විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ

| *පාර්සලයේ වටිනාකම* | *වටිනාකමේ ප්‍රතිශතය* |
|---|---|
| රු. 1,000.00 දක්වා | නැත |
| රු. 1,000.00 සිට රු. 5,000.00 දක්වා | 1.5% |
| රු. 5,000.00 සිට රු. 10,000.00 දක්වා | 2.25% |
| රු. 10,000.00 සිට රු. 20,000.00 දක්වා | 3% |
| රු. 20,000.00 ට වැඩි | 4.5% |

iii. රු. 1,000.00 වැඩි වටිනාකමක් ඇති භාණ්ඩ ප්‍රවාහනය සඳහා බාර ගැනීමේදී අනිවාර්යයෙන්ම වටිනාකම සහතික කිරීම සඳහා යවන්නාගේ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය. වටිනාකම් ප්‍රකාශය සමග බිල්පතක පිටපතක් වුව ද ඉදිරිපත් කළ හැකිය. ඒ අනුව යවනු ලබන දුම්රිය ස්ථානයෙන් නිකුත් කරනු ලබන මාර්ග බිල්පතේ පහළින් එහි වටිනාකම හා ධාරිතාව සඳහන් කළ යුතුය. පාර්සලය යවන්නා විසින් නියමිත වටිනාකම ඉදිරිපත් නොකරන්නේ යැයි හැඟීයන අවස්ථාවකදී නියමිත වටිනාකම සඳහන් කරන ලෙස යවන්නාට දැනුම් දිය යුතු අතර එම ඉල්ලීම ඉටු කිරීමට අකමැති වන්නේ නම් පාර්සලය ප්‍රවාහනයේ දී සිදුවන නැතිවීම්, හානි වීම් සහ ප්‍රමාද වීම්වලදී වටිනාකම අයිතිකරුට ප්‍රතිපූරණය කරනු නොලැබේ.

iv. සාමාන්‍ය පාර්සල් ගාස්තුව යනුවෙන් අදහස් කරනුයේ 34 ජී චක්‍රය අනුව ගණනය කරන පාර්සල් ගාස්තුව වේ.

v. මාළු ප්‍රවාහනය සඳහා විශේෂයෙන් බලය දී ඇති දුම්රියවල අයිතිකරු විසින්ම මාළු රැගෙන යන අවස්ථාවන්හිදී එක් එක් මාළු කූඩය සඳහා ඒවායේ බරට වෙන වෙනම සාමාන්‍ය ගාස්තුවට අමතරව 50%ක වැඩිපුර ගාස්තුවක් අය කළ යුතුය.

vi. පහත සඳහන් කරනු ලබන වර්ගයේ පාර්සල් හෝ වැගන්වල වැඩි ඉඩක් ගන්නායැයි හැඟී යන පාර්සල් සහ සාමාන්‍ය පාර්සල් සාමාන්‍ය, තැපැල්, සීඝ්‍රගාමී දුම්රිය හා නගරාන්තර දුම්රියවලින් ප්‍රවාහනය කරනු ලබන කල්හි පහත දක්වා ඇති පරිදි ගාස්තු අය කළ යුතුය.

| | *සාමාන්‍ය දුම්රිය* | *තැපැල් හා සීඝ්‍රගාමී දුම්රිය* | *නගරාන්තර දුම්රිය* |
|---|---|---|---|
| • කුඩා කොටස් වශයෙන් ප්‍රවාහනය කරනු ලබන ගෘහභාණ්ඩ හා දුම්රිය මැදිරි හා වැගන්වල වැඩි ඉඩ ප්‍රමාණයක් අවශ්‍යවන්නේයැයි හැඟී යන පාර්සල් හෝ හැසිරවීම අපහසු පාර්සල් උදාහරණ ලෙස - වාතාශ්‍රය සහිත පෙට්ටිවල යවනු ලබන කුකුළු පැටවුන්, හිස් මිනී පෙට්ටි, ටයර්, කුඩ, කුෂන් මෙට්ට, කොහුලණු, කොට්ට, රිජිෆෝම් පෙට්ටි, හිස් ප්ලාස්ටික් කූඩ, බොක්ස් ෆයිල් කවර, ත්‍රීවිල් බක්කි, යතුරු පැදි කොටස්, තහඩු, සෝෆා පුටු වැනි භාණ්ඩ එක්ස් රේ කාඩ්, සායනික ද්‍රව්‍ය වන පුලුන්, ගෝස්, අත්වැසුම්, සිරින්ජර්, මුව ආවරණ ආදිය, දැන්වීම් පුවරු ආදිය<br><br>• ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර, රූපවාහිණී හා පරිගණක යන්ත්‍ර ආදිය. | සාමාන්‍ය පාර්සල් ගාස්තුව (34 ජී චක්‍රයෙහි ගාස්තුව) මෙන් දෙගුණයක් අය කළ යුතුය. | සාමාන්‍ය ගාස්තුව (34 ජී චක්‍රයෙහි ගාස්තුව) මෙන් තුන් ගුණයක් අය කළ යුතුය. | සාමාන්‍ය ගාස්තුව (34 ජී චක්‍රයෙහි ගාස්තුව) මෙන් හතර ගුණයක් අය කළ යුතුය. |
| • ඉහත වර්ගීකරණයට අයත් නොවන අනෙකුත් සියලුම පාර්සල් | සාමාන්‍ය පාර්සල් ගාස්තුව (34 ජී චක්‍රයෙහි ගාස්තුව) අය කළ යුතුය. | සාමාන්‍ය ගාස්තුව (34 ජී චක්‍රයෙහි ගාස්තුව) මෙන් දෙගුණයක් අයකළ යුතුය. | සාමාන්‍ය ගාස්තුව (34 ජී චක්‍රයෙහි ගාස්තුව) මෙන් $2^{1/2}$ ගුණයක් අයකළ යුතුය. |

vii. මිනිස් අවයව සහ ඇස් ප්‍රවාහනය - නොමිලේ.
දෙපාර්තමේන්තුව විසින් සලසන සුවිශේෂී මානුෂීය සේවාවක් සේ සලකා සේවා මාර්ග බිල් පත්‍ර යටතේ මිනිස් ඇස් නොමිලේ ප්‍රවාහනය කිරීම සිදු කළ යුතුය.

viii. අයිතිකරු සමග රැගෙන යන පාර්සල්

අයිතිකරු සමග රැගෙන යාමට අවසර දෙනු ලබන පාර්සලයක් කි.ග්‍රෑ. 25ට නොවැඩි විය යුතු අතර අනෙකුත් මගීන්ගේ නිදහස් ගමනට අවහිර නොවන ආකාරයේ පාර්සලයක් විය යුතුය. පාර්සල් ගාස්තු අයකිරීම සඳහා දී ඇති උපදෙස් ඒ අයුරින්ම ක්‍රියාත්මක කළ යුතු අතර පාර්සලය නැති වීම සම්බන්ධයෙන් හෝ පාර්සලයට සිදුවන හානියක් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ. අයිතිකරු සමග රැගෙන යන පාර්සල් සඳහා 34 (ජී) vi හි දක්වා ඇති පරිදි පාර්සල් වර්ගීකරණය හා දුම්රිය වර්ගීකරණය අනුව ගණනය කරන ගාස්තුව මෙන් දෙගුණයක ගාස්තුවක් අය කළ යුතුය.

ix. රෙගුලාසි 46, රෙගුලාසි 54, රෙගුලාසි 55, රෙගුලාසි 56 යටතේ සාමාන්‍ය දුම්රියෙන් ප්‍රවාහනය කරන විටදී අය කර ගත යුතු ගාස්තු දක්වා ඇති අතර තැපැල්, සීඝ්‍රගාමී හා නගරාන්තර දුම්රියෙන් ප්‍රවාහනය කරන විට 34 (ජී) vi යටතේ දක්වා ඇති පරිදි දුම්රිය වර්ගීකරණය අනුව ප්‍රවාහන ගාස්තු අය කර ගත යුතුය.

x. ප්‍රවාහනය පිණිස එකවර භාර දෙනු ලබන බඩු තොගයක් කි.ග්‍රෑ. 500 කට වඩා වැඩි වන අවස්ථාවකදී හෝ ප්‍රමාණයෙන් BCGS වැගනයකින් 1/4 ක් ඉක්මවන අවස්ථාවකදී එම බඩු තොගය වැගන් මගින් බඩු ප්‍රවාහන ගාස්තු යටතේ ප්‍රවාහනය කිරීමට කටයුතු කළ යුතුය.

**රෙගුලාසි 37 - ලිපි**

37 රෙගුලාසියේ රු. 30.00 ලොප්කර, ඒ වෙනුවට රු. 50.00 ආදේශ කරන්න.

**රෙගුලාසි 46 - තිත් මුවන්, උෟරන්, වසු පැටවුන්, බැටළුවන් හා එළුවන්**

46 රෙගුලාසියේ සතෙකුට කිලෝ මීටරයක් සඳහා අයකරන ගාස්තුව රු. 2.00 ලොප්කර ඒ වෙනුවට රු. 5.00 ක් ආදේශ කරන්න. කෙසේ වුව ද එක් සතෙක් සඳහා අවම ගාස්තුව රු. 500.00 ක් විය යුතුය.

51 මෝටර් රථවාහන

51 (ඒ) මෝටර් සයිකල් හා රෝද දෙකේ ට්‍රැක්ටර් ද ඇතුලත්ව මෝටර් වාහන සහ යන්ත්‍රෝපකරණ සඳහා පවත්නා ගාස්තු ලොප් කර යෝජිත ගාස්තු ආදේශ කරන්න.

| | *රඹුක්කනින් පහළ කිලෝ මීටරයට රු.ශ.* | *රඹුක්කනින් ඉහළ කිලෝ මීටරයට රු.ශ.* |
|---|---|---|
| සාමාන්‍ය ගැලක් සඳහා | 320.00 | 400.00 |
| බෝගි ගැලක් සඳහා | 320.00 | 400.00 |

මීට අදාළව ගාස්තු ගණනය කිරීමේදී අවම ගාස්තුව කි.මී. 100 කට අය කරන්න.

51 (බී) මෝටර් සයිකල් හා රෝද දෙකේ ට්‍රැක්ටර් නියාමක මැදිරියේ ප්‍රවාහනය කිරීම සඳහා පවත්නා ගාස්තු ලොප් කර යෝජිත ගාස්තු ආදේශ කරන්න.

| | *කි.මී. 01 ට ගාස්තුව රු.ශ.* | *අවම ගාස්තුව රු.ශ.* |
|---|---|---|
| මෝටර් සයිකලයකට | 9.00 | 1000.00 |
| මෝටර් ස්කූටරයකට | 10.00 | 1000.00 |
| පැති කාරය සමග මෝටර් සයිකලයකට | 11.00 | 1000.00 |
| රෝද දෙකේ ට්‍රැක්ටරයකට | 12.00 | 1500.00 |

i. මෝටර් සයිකල් දුම්රියෙන් ප්‍රවාහනය කරන විට ලියාපදිංචි සහතිකය, ආදායම් බලපත්‍රය, ජාතික හැඳුනුම් පත, රක්ෂණ සහතිකය යන ලියකියවිලි මෝටර් සයිකලයේ ලියාපදිංචි අයිතිකරු විසින්ම භාර දිය යුතුය. ලියාපදිංචි අයිතිකරු විසින් ප්‍රවාහනය පිණිස භාර නොදෙන අවස්ථාවකදී ඉහත ලියකියවිලි සමග ප්‍රවාහනයට කැමැත්ත පළ කරන ලද ලියාපදිංචි අයිතිකරුගේ ලිපියක් හා යවනු ලබන අයගේ ජාතික හැඳුනුම්පතහි ඡායාපිටපතක් ඉදිරිපත් කළ යුතුය.

ii. මෝටර් සයිකලයේ ලියාපදිංචිය යම් ආයතනයක් සතුව පවතින්නේ නම් ඉහත ලියකියවිලිවලට අමතරව එම ආයතනය විසින් ප්‍රවාහනය සඳහා බලය පවරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

iii. 48CC වර්ගයේ මෝටර් බයිසිකල් ප්‍රවාහනය කරන විට අයිතිය තහවුරු කිරීම පිණිස ග්‍රාමනිලධාරීගේ සහතිකයක් හෝ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

iv. ඉහත i,ii සහ iii අවස්ථා තුනෙහිදීම සඳහන් ලේඛනවල, අනු පිටපත් භාර දිය යුතු අතර අවශ්‍ය අවස්ථාවේ පරීක්ෂා කිරීම සඳහා එය දුම්රිය ස්ථානාධිපති භාරයේ තිබිය යුතුය.

**රෙගුලාසි 54 - ලොකර්වල ප්‍රවාහනය කරන සුනඛයන්**

54 රෙගුලාසියේ කි.මී.01 කට ගාස්තුව රු. 3.00 ක් ලොප් කර රු.06.00 ආදේශ කරන්න. අවම ගාස්තුව රු. 150.00 ලොප් කර රු. 500.00 ආදේශ කරන්න.

**රෙගුලාසි 55 - බයිසිකල්**

i. 55 රෙගුලාසියේ කි.මී. එකකට ගාස්තුව රු. 3.00 ක් ලොප් කර රු.07.00 ආදේශ කරන්න. අවම ගාස්තුව රු. 150.00 ලොප් කර රු. 500.00 ආදේශ කරන්න.

ii. දුම්රියෙන් පාපැදි ප්‍රවාහනය කරන විටදී අයිතිකරු පදිංචි බල ප්‍රදේශය තුළ පාපැදිය ලියාපදිංචි කළ සහතිකය (ප්‍රාදේශීය සභා/නගර සභා/මහා නගර සභා) සහ අයිතිකරුගේ ජාතික හැඳුනුම් පතෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය. අලුතින් මිල දී ගත් පාපැදියක් ප්‍රවාහනය කරන විට පාපැදිය මිල දී ගත් රිසිට් පතෙහි හා යවන්නාගේ ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

iii. ඉහත ii අවස්ථාවේ සඳහන් ලේඛනවල, අනුපිටපත් භාරදිය යුතු අතර අවශ්‍ය අවස්ථාවේ පරීක්ෂා කිරීම සඳහා එය දුම්රිය ස්ථානාධිපති භාරයේ තිබිය යුතුය.

**රෙගුලාසි 56 - ආබාධිතයන්ගේ පුටු, රෝද සවිකළ බැරල් සහ පියානෝ ඕගන්, රෝද තුනේ ට්‍රයිසිකල් සහ ජින් රික්ෂෝ රථ ශීතකරණ.**

i. 56 රෙගුලාසියේ සඳහන් රෝද සවිකළ බැරල් සහ පියානෝ ඕගන්, රෝද තුනේ ට්‍රයිසිකල් සහ ජින් රික්ෂෝ රථ ශීතකරණ ප්‍රවාහනයට කි.මී.එකකට අය කර ගත යුතු ගාස්තුව රු. 7.00 කි. පවත්නා අවම ගාස්තුව වන රු. 375.00 ලොප් කර 500.00 ආදේශ කරන්න.

ii. ආබාධිත පුටු එකකට වඩා වැඩියෙන් සහ රෝද තුනේ ට්‍රයිසිකල් ප්‍රවාහනය කරන අවස්ථාවකදී තනි පුටුවක් හෝ ට්‍රයිසිකලයක් සඳහා කි.මී. 01 ට රු.5.00 ක ගාස්තුවක් අය කළ යුතුය. එක් අයිතමයක් සඳහා අවම ගාස්තුව රු.1000.00 කි.

**57 රෙගුලාසිය - ආබාධිත තනි පුටුවක් යවන විට රු.250.00 ක් ඕනෑම දුම්රිය ස්ථානයකට අය කිරීම ඇතුළත්ය.**

**60 (එෆ්) - බයිසිකල් ආදිය සඳහා මාර්ගෝපකරණ කාමර ගාස්තු**

60 (එෆ්) රෙගුලාසියේ

i. රු. 25.00 ලොප් කර 50.00 ආදේශ කරන්න. - පාපැදි සඳහා කාමර ගාස්තු.

ii. රු. 50.00 ලොප් කර 100.00 ආදේශ කරන්න. - මෝටර් සයිකල් සඳහා කාමර ගාස්තු.

iii. රු. 80.00 ලොප් කර 100.00 ආදේශ කරන්න. - 56 රෙගුලාසිය යටතේ ගැනෙන භාණ්ඩ සඳහා කාමර ගාස්තු.

**රෙගුලාසි 61 - අත්හැර දමා ගිය ගමන් බඩු**

61 (ඒ) රෙගුලාසියේ ලේඛන ගත කිරීමේ ගාස්තු යටතේ රු. 20.00 ක් ලොප් කර රු.150.00 ආදේශ කරන්න.

මෙම රෙගුලාසියේ රු. 15.00 දැක්වෙන ස්ථානවල එය ලොප් කර රු. 30.00 ආදේශ කරන්න.

61 (අයි) රෙගුලාසියේ ලොකර් ගාස්තු යටතේ - පවත්නා රු. 30.00 ක් ලොප් කර දිනකට හෝ කොටසකට පහත පරිදි ගාස්තු අය කරන්න.

කුඩා ලොකර් සඳහා රු. 150.00

මධ්‍යම ප්‍රමාණයේ ලොකර් සඳහා රු. 200.00

විශාල ප්‍රමාණයේ ලොකර් සඳහා රු. 250.00

යතුරු නැති වීම සඳහා වූ ගාස්තුව වන රු. 300.00 ලොප් කර ඒ වෙනුවට රු. 500.00 ආදේශ කරන්න.

**රෙගුලාසි 62 - හිමිකම් නොපෑ හෝ නැති වී සොයා ගත් භාණ්ඩ**

62 (බී) හි අවම ගාස්තුව රු. 250.00 ක් වශයෙන් සංශෝධනය විය යුතුය.

**රෙගුලාසි 13 ඒ - තැපැල් ප්‍රවාහනය**

ඉදිරියේදී ඩීසල් මිලෙහි සිදුවන රු.40.00 ක වැඩි වීමකදී හෝ අඩු වීමකදී පහත දක්වා ඇති ප්‍රවාහන ගාස්තුව එම උච්චාවචන අනුපාතයට ගැලපීමට යටත් වේ.

පවත්නා ඩීසල් මිල රු. 306.00 යටතේ අය කළ යුතු ප්‍රවාහන ගාස්තුව පහත පරිදි වේ.

| | *රඹුක්කනින් පහළ කිලෝ මීටරයකට රු.* | *රඹුක්කනින් ඉහළ කිලෝ මීටරකයට රු.* |
|---|---|---|
| ජංගම තැපැල් මැදිරිය | 140.00 | 180.00 |
| තිරිංග මැදිරියෙන් අඩක් | 90.00 | 160.00 |
| නියාමක භාරයේ තැපැල් | 80.00 | 100.00 |
| තැපැල් ප්‍රවාහනය කරන බෝගී ආවරණ වැගනයක් | 100.00 | 160.00 |
| රෝද හතරේ වැගනයක් | 80.00 | 120.00 |

**තොග ප්‍රවාහනය කිරීම**

**රෙගුලාසි 10 -** ඉන්ධන මිලෙහි සිදුවන උච්චාවචන අනුව ප්‍රවාහන ගාස්තුව ගැලපිය යුතුය. ඒ අනුව ෂන්ටින් ගාස්තු හා හිස් ධාවන ගාස්තු ද ඇතුළත්ව 1 හා 2 පන්ති සඳහා පහත පරිදි ගාස්තු අය කළ යුතුය.

**රෙගුලාසි 10(ඒ) - (ස) - භාණ්ඩ ප්‍රවාහනය**

ඉදිරියේ දී ඩීසල් මිලෙහි සිදුවන රු.40.00 ක වැඩි වීමකදී හෝ අඩු වීමකදී පහත දක්වා ඇති ප්‍රවාහන ගාස්තුව එම උච්චාවචන අනුපාතයට ගැලපීමට යටත් වේ.

පවත්නා ඩීසල් මිල රු. 306.00 යටතේ අය කළ යුතු ප්‍රවාහන ගාස්තුව පහත පරිදිය.

| | *මෙ. ටොන්/කිලෝමීටරයකට* | |
|---|---|---|
| | *රඹුක්කනින් පහළ රු.ශ* | *රඹුක්කනින් ඉහළ රු.ශ* |
| 1 වැනි පන්තිය | 6.50 | 8.00 |
| 2 වැනි පන්තිය | 9.50 | 10.50 |

වෙළඳ බිල්පත් යටතේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා සහ ගිවිසුම්ගත භාණ්ඩ ප්‍රවාහනය සඳහා 2023.08.01 දින සිට පවත්නා ඩීසල් මිල යටතේ දක්වා ඇති ප්‍රවාහන ගාස්තුව අදාළ කර ගත යුතුය.

**රෙගුලාසි 11(ඒ)ii - ඉන්ධන ප්‍රවාහනය සඳහා අවම දුර**

තොග ප්‍රවාහනය සඳහා රෙගුලාසි ii (ඒ) හි සඳහන් අවම දුර කි.මී. 100 ක් ලෙස එලෙසම පවතින අතර කටුනායක දක්වා සිදුකරන ගුවන් යානා ඉන්ධන ප්‍රවාහන ගාස්තු සැකසීමේදී පමණක් කොළොන්නාව/කටුනායක අතර පවත්නා දුර අදාළ කර ගත යුතු වේ. මෙම ප්‍රවාහන ගාස්තු සැකසීම අංක 2287/25 හා 2022 ජුනි 07 දරන *ගැසට් පත්‍රය* ක්‍රියාත්මක වූ දින සිට අදාළ වේ.

**රෙගුලාසි 10(ඒ)(ii) -**

විවිධ දුම්රිය ස්ථානයන් සඳහා ඉන්ධන ප්‍රවාහන ගාස්තු චක්‍රය භාවිත කර ගාස්තු ගණනයේදී එක් එක් ඉන්ධන ටැංකිය සඳහා ලැබෙන ප්‍රවාහන ගාස්තුව ආසන්න ඉහළ රු. 10.00 ට වැටයීම සිදු කළ යුතු අතර එය අංක 2287/25 හා 2022 ජුනි 07 දරන *ගැසට් පත්‍රය* ක්‍රියාත්මක වූ දින සිට අදාළ වේ.

**රෙගුලාසි 11 - අවම හා කොටස් සඳහා ගාස්තු අය කිරීම.**

i. පැටවීමේ ධාරිතාවය මෙ.ටොන් 13.20 නොඉක්මවන රෝද හතරේ වැගනයක් සඳහා රු. 3,000.00
ii. පැටවීමේ ධාරිතාවය මෙ.ටොන් 26.40 නොඉක්මවන රෝද අටේ වැගනයක් සඳහා රු. 4,000.00
iii. පැටවීමේ ධාරිතාවය මෙ.ටොන් 26.40 ඉක්මවන එහෙත් මෙ.ටොන් 39.60 නොඉක්මවන රෝද අටේ වැගනයක් සඳහා රු. 5,000.00
iv. පැටවීමේ ධාරිතාවය මෙ.ටොන් 39.60 ඉක්මවන රෝද අටේ වැගනයක් සඳහා රු. 6,000.00

**රෙගුලාසි 23 - වැගන් සඳහා ප්‍රමාද ගාස්තු**

රෙගුලාසි 23 යටතේ පවත්නා (ඒ), (බී), (සී), (ඩී), (ඊ) හා (එෆ්) ලොප් කර පහත ඡේද ආදේශ කරන්න.

**රෙගුලාසි 23(ඒ) -**

සෑම දුම්රිය ස්ථානයකදීම වැගන් සපයා දිනක් ඇතුළත එනම් වැඩ කරන පැය 08 ක් ඇතුළත ඒවාට බඩු පටවා නිම කළ යුතුය. වැගන් ඇණවුම් කර නියමිත කාලය ඇතුළත ඒවාට බඩු පැටවීමට අපොහොසත් වන හෝ, බඩු පැටවුව ද වාර්ණාපත්‍ර ඉදිරිපත් කිරීමට අපොහොසත්වන බඩු යවන්නා එකී ප්‍රමාදයන් සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට බැඳී සිටින අතර දිනක් සඳහා රෝද හතරේ හෝ රෝද අටේ බෝගී එක් වැගනයක් සඳහා ප්‍රමාද ගාස්තුව දිනකට එනම් වැඩ කරන පැය 08 ක් සඳහා රු. 2500.00 නොවෙනස්ව පවතින අතර වැඩකරන පැයකට හෝ ඉන් කොටසකට ප්‍රමාද ගාස්තුව රු. 350.00 බැගින් ගෙවිය යුතුය.

**රෙගුලාසි 23(බී) -**

රාත්‍රියේ පැටවීම් කිරීම සඳහා විශේෂයෙන් 0වැගන් සැපයූ විට ප.ව. 06.00 සිට පසු දින උදෑසන 06.00 වන විට පැටවුම් සම්පූර්ණ නොකළහොත් වැඩකරන පැයකට හෝ ඉන් කොටසකට රෝද හතර හෝ රෝද අටේ වැගනයක් සඳහා රු. 350.00 බැගින් ප්‍රමාද ගාස්තු අය කරනු ලැබේ.

**රෙගුලාසි 23(සී) -** බඩු බෑමේදී ලබා දී ඇති නියමිත කාලයට වඩා ප්‍රමාදවන එක් දිනක් සඳහා ප්‍රමාද ගාස්තු.

සෑම දුම්රිය ස්ථානයකදීම බඩු සහිත වැගන් පැමිණ බඩු බෑම සඳහා ස්ථානගත කිරීමෙන් පසු දිනක් ඇතුළත එනම් වැඩ කරන පැය 08 ක් ඇතුළත ඒවායේ බඩු බෑම අවසන් කළ යුතුය. එලෙස බඩු බෑමට අපොහොසත් වන්නේ නම් ලබන්නා එකී ප්‍රමාදයන් සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට බැඳී සිටින අතර දිනක් සඳහා එනම් වැඩ කරන පැය 08 ක් සඳහා රෝද හතරේ හෝ රෝද අටේ බෝගී එක් වැගනයක් සඳහා ප්‍රමාද ගාස්තුව දිනකට රු. 2500.00 කි. වැඩකරන පැයකට හෝ ඉන් කොටසකට ප්‍රමාද ගාස්තුව රු. 350.00 බැගින් ගෙවිය යුතුය.

**රෙගුලාසි 23(ඩී) -**

වැගන්වල ඇති බඩු බෑම හෝ පැටවීම සඳහා ස්ථානගත කර වැඩ කරන පැය 08 ක් එක් දිනයක් සේ සලකා එම දිනය අතහැර ඉන්පසු ප්‍රමාද වන වන කාලයට ප්‍රමාද ගාස්තු අය කරනු ලැබේ. වැගන් ප්‍රමාද ගාස්තු ගණන් බැලීමේදී සියලුම ප්‍රසිද්ධ, වෙළඳ හා පසළොස්වක පොහොය නිවාඩු දිනයන්, ඉරු දිනයන් සහ 1965 අංක 17 දරන ජාතික නිවාඩු පනත යටතේ ප්‍රකාශයට පත් කෙරෙන වෙනත් ඕනෑම ප්‍රසිද්ධ නිවාඩු දිනයන් අත්හැර දමනු ලැබේ.

EOG 01 - 0138

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.